අධිකරණ අමාත්‍යාංශය

நீதி அமைச்சு

# Ministry of Justice



# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

2013

# කාර්යසාධන වාර්තාව

# අධිකරණ අමාත්‍යාංශය

**2013- ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

අධිකරණ අමාත්‍යාංශය

උපරිමාධිකරණ සංකීර්ණය

කොළඹ **12.**

**www. justiceministry.gov.lk**

ගරු අධිකරණ අමාත්‍ය

රවුෆ් හකීම් මැතිතුමා

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්

කමලිනී ද සිල්වා මහත්මිය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 1. අධිකරණ අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 04 |
| 2. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් | 05 |
| 3. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු වල කාර්යයන් | 06 |
| 4. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව | 08 |
| 5. අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හී ප්‍රගතිය | |
| 5.1 නීති අංශය | 09 |
| 5.2 පාලන හා ආයතන අංශය | 15 |
| 5.3 යටිතල පහසුකම් අංශය | 19 |
| 5.4 ගිණුම් අංශය | 23 |
| 5.5 සැලසුම් අංශය | 24 |
| 5.6 අධිකරණ නොවන නිලධාරීන් සඳහා පුහුණු ආයතනය | 25 |
| 5.7 අභ්‍යන්තර විගණන අංශය | 26 |
| 6. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන | |
| 6.1 රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 27 |
| 6.2 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 29 |
| 6.3 ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | 30 |
| 6.4 ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව | 32 |
| 6.5 සමථ මණ්ඩල කොමිෂන් සභාව | 36 |
| 7. අධිකරණ | |
| 7.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | 40 |
| 7.2 අභියාචනාධිකරණය රෙජිස්ට්‍රාර් කාර්යාලය | 42 |
| 7.3 කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | 43 |
| 7.4 කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි | 45 |
| 8. අනෙකුත් ආයතන | |
| 8.1 නීති විද්‍යාලය | 47 |

# අධිකරණ අමාත්‍යාංශය

## දැක්ම

යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂම ක්‍රමයක්

ගෝලීය උන්නතීන්ට හා ජනතා අපේක්ෂාවන්ට සරිලන පරිදි සමාජීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## මෙහෙවර

- කාර්යක්ෂම හා අර්ථවත් ලෙස යුක්තිය පසිඳලීමේ අරමුණ ඇතිව ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
- පුරවැසියන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් පිළිගැනීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කිරීම;

## 02. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන්

- යුක්තිය පසිඳලීම, පරිපාලනය කිරීමේ යාන්ත්‍රණයට අදාලවන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් සම්පාදනය කිරීම
- අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වෙනත් කිසිදු ආයතනයක් වෙත පවරා දෙනු නොලැබූ යුක්තිය පසිඳලීමේ අධිකරණයන්හි පරිපාලනය පිළිබඳ කටයුතු
- උසාවි පරිපාලනය
- යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඩුවම් සම්බන්ධයෙන් සමාවදීම, එම දඩුවම් අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් උපදෙස් දීම
- කම්කරු විනිශ්චය සභාවන්ට අදාල කටයුතු
- නීති ප්‍රතිසංස්කරණ කටයුතු
- නීති ශබ්ද මාලා පිළියෙල කිරීම හා නිකුත් කිරීම
- සමස්ත ක්වාසි පද්ධතියේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- යුක්තිය පසිඳලීම පරිපාලනයේ ප්‍රමාදයන් වැලැක්වීම පිණිස අධිකරණ පද්ධතියේ උපදෙස් මත වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකා නීති වර්තා පළකිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු / ආයතන අධීක්ෂණය සහ එම ආයතනවලට පැවරි ඇති අනෙකුත් සියලුම විෂයයන්

## 03. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු වල කාර්යයන්

**රජයේ රස පරීක්ෂකදෙපාර්තමේන්තුව**

රජයට, රාජ්‍ය අනුග්‍රහයලත් ආයතනවලට, පළාත් පාලන ආයතනවලට සහ අධිකරණවලට විද්‍යාත්මක, විද්‍යාගාර සහ උපදේශක සේවා සැලසීම.

**නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් නීති සංග්‍රහගත කිරීම, යල්පැන ගිය සහ අනවශ්‍ය නීති ඉවත් කිරීම, නීතිය සරල කිරීම හා සංශෝධනය මඳ වශයෙන් වෙනස් කිරීම, අනු නීති සමාලෝචනය කිරීම , නඩුකීම පිළිබඳ කාර්යය පටිපාටිය යථාවත් කිරීම සහ නීතිය පිළිබඳ පර්යේෂණ පැවැත් වීම.

**අධිකරණ අමාත්‍යාංශය**

**ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව**

උකස් බැඳුම්කර සහ වෙනත් නිශ්චල දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු ණය සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීම.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය**

ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම සහ අභියාචනා ඉල්ලුම්පත් ලැයිස්තුගත කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවාගැනීම.

## මහින්ද චින්තන ඉදිරිදැක්මට අනුව

- අඩු ආදායම්ලාභීන් වෙත නොමිලයේ නීති සහාය ලබා දීම සඳහා නීති ආධාර මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටුවීම.
- කොළඹට පමණක් සීමාවී තිබූ අභියාචනා අධිකරණ කටයුතු පළාත්බදව ව්‍යාප්ත කිරිම.
- සමථකරණ පද්ධතිය ව්‍යාප්ත කිරීම මගින් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරිම.
- වඩාත් කාර්යක්ෂම යුක්තිය පසිඳලීමේ ක්‍රම සඳහා නව නීති හඳුන්වා දීම.
- උතුරේ නැවත  අධිකරණ ක්‍රියාදාමය ස්ථාපිත කිරීම.
- මුස්ලිම් හදිසි මරණ පරීක්ෂක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරිම සහ අවශ්‍ය ප්‍රදේශ වලට එම තනතුරු ඇති කිරීමට කටයුතු කිරිම.
- කම්කරු විනිශ්චය සභා ව්‍යාප්ත කිරීම තුලින් කාර්යක්ෂමව ආරවුල් නිරවුල් කිරිමේ යාන්ත්‍රණය සවිමත් කිරීම.
- රසපරික්ෂක දෙපාර්තමේන්තුවේ කටයුතු ඉක්මන් කිරිම සඳහා නවීන තාක්ෂණයෙන් යුක්ත විද්‍යාගාරයක් සහ කාර්යාල පහසුකම් ලබාදිම.
- නඩු ප්‍රමාදයන් වැලැක්විම සඳහා කෙටි කාලීන හා දිගු කාලීන  පියවර ගැනීම.
- ළමයින් සඳහා වෙන්වු අධිකරණ පද්ධතිය පුළුල් කිරීමට පියවර ගැනීම.
- ණය සහන මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරිම.

## 04. අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් සංක්ෂිප්තව

- අමාත්‍යාංශයේ කාර්යයන් පහත අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබයි. එනම්,
    - i. නීති අංශය
    - ii. පාලන අංශය
    - iii. යටිතල පහසුකම් අංශය
    - iv. ගිණුම් අංශය
    - v. සැලසුම් අංශය
    - vi. අභ්‍යන්තර විගණන අංශය

**i.** නීති අංශය

යුක්තිය පසිඳලීමට අදාල නීති සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම, නීති වාර්තා පළකිරීම, නීති ආධාර ලබා දීම, අපරාධ, සිවිල් සහ වාණිජ කරුණු සම්බන්ධයෙන් සහ අන්තර්ජාතික ළමා අපහරණය පිළිබඳ සිවිල් පැතිකඩයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා දීම සඳහා මධ්‍යම බලධාරියා වශයෙන් කටයුතු කිරීම, 1995 අංක 05 දරණ පනත යටතේ සිරකරුවන් මාරුකිරීම, සිරකරුවන් සමාව ප්‍රදානය කිරීම පිළිබඳ නිර්දේශයන් ලබා දීමත් නීති අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

**ii.** පාලන අංශය

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් හැර අනිකුත් සියළුම නිලධාරීන්ගේ සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පරිපාලන කටයුතු කිරීම.

**iii.** යටිතල පහසුකම් අංශය

අධිකරණ ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස සහ කම්කරු විනිශ්චය සභා ඉදිකිරීම, අධිකරණ ගොඩනැගිලි, විනිශ්චයකාරවරුන්ගේ නිල නිවාස හා කම්කරු විනිශ්චය සභා කාර්යාල ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම.

**iv.** ගිණුම් අංශය

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල මූල්‍ය සැලසුම් කළමනාකරණය සහ පාලනය.

**v.** සැලසුම් අංශය

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, ප්‍රගති පාලනය සහ සුපරීක්ෂණය.

**vi.** අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ හා එය යටතේ පවතින දෙපාර්තමේන්තුවල සහ අධිකරණවල ගිණුම් විගණනය.

## 05. අධිකරණ අමාත්‍යාංශයේ එක් එක් අංශයන්හි ප්‍රගතිය

### 5.1 නීති අංශය

මෙම වසරේ 2013.12.31 වන විට නීති අංශය මගින් නව පනත් කෙටුම්පත් හා පනත් (සංශෝධන) සම්මත කිරිමේ ප්‍රගතිය පහත සඳහන් පරිදිවේ.

1. ළමා ආරක්ෂක පනත් කෙටුම්පත

   මෙම පනත් කෙටුම්පත මගින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් වර්තමානයට ගැලපෙන පරිදි ප්‍රතිපාදන සැලසීමට මෙන්ම ළමා හා තරුණ පුද්ගලයින් සම්බන්ධ ආඥා පනත යාවත්කාලීන කිරීමට අපේක්ෂා කරයි. මේ මගින් අධිකරණය, පරිවාසය හා පොලීසිය අතර සහයෝගීතාවය වැඩි කිරීමට බලාපොරොත්තු වන අතර ළමයාගේ උපරිම සුභ සාධනය සැලසීමට අපේක්ෂා කරයි. මෙම පනත ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් නැවත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි.

2. කාලාවරෝධී විශේෂ විධිවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත

   කාලාවරෝධී ආඥා පනතේ ප්‍රතිපාදන වලින් අවතැන්වූ හා අසාධාරණයට ලක්වූ දේපල හිමිකරුවන්ට සහනයක් ලබාදීමට අපේක්ෂා කරයි. මෙම පනත් කෙටුම්පත ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාර සභාවේ නිර්දේශ සහිතව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇත.

3. කාලාවරෝධී අඥාපනතේ සංශෝධනය (15 වගන්තිය)

   ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාර සභාවේ නිර්දේශ ලබා ගැනීමෙන් පසු එම නිර්දේශ ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් මෙම පනත කෙටුම්පත් කර ඇත.

4. අශ්ශීල ප්‍රකාශන පනත් කෙටුම්පත

   පරිගණක අපරාධ පනතෙහි පරිගණක ආධාරයෙන් සිදු කරන ළමයින් පිළිබඳ අසභ්‍ය දර්ශනවලට අදාල වගන්තියක් ඉවත්කර මෙම නව පනතට ඇතුලත්කර ඇත. මෙම පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

5. අපරාධ නඩු විධාන සංග්‍රහ (විශේෂ විධි විධාන) පනත

   2013.01.22 දින මෙම පනත පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදී. (2013 අංක 02)

6. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය

   ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැලැස්ම මගින් සිදු කල නිර්දේශයන් ඇතුලත් කරමින් මෙම පනත් කෙටුම්පත සකස් කර ඇත.

**7.** ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත් කෙටුම්පත

ජාතික මානව හිමිකම් ක්‍රියාකාරි සැලැස්ම මගින් සිදුකල නිර්දේශයන් සැලකිල්ලට ගනිමින් මෙම පනත් කෙටුම්පත සකස් කර ඇත.

**8.** කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත

කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන් විසින් ලබා දෙන තීන්දු බලාත්මක කිරීම සඳහා විධිවිධාන මෙම පනත් කෙටුම්පත මගින් සලසා ඇත. කෙසේ වුවද වෘත්තීය සමිති විසින් මෙම පනතේ ප්‍රතිපාදන සම්බන්ධයෙන් විරෝධතාවය දක්වා ඇත.

**9.** අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් වෙත සහාය හා ආරක්ෂාව සැලැස්වීමේ පනත් කෙටුම්පත

මෙම පනත මගින් අපරාධ වින්දිතයින් හා සාක්ෂි කරුවන් වෙත සහය හා ආරක්ෂාව සැලසීමේ ප්‍රතිපාදන සපයයි. මෙම පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**10.** නොතාරිස් ආඥා පනත (සංශෝධන) පනත් කෙටුම්පත

වංචා සහගත ඉඩම් ගනු - දෙනු සිදුවෙමින් පවතින නිසා නොතාරිස් ආඥා පනත සංශෝධනයට යොමු කර ඇත. මෙහිදී ඔප්පුවට අත්සන් තබන අවස්ථාවේදී ජීවමිතික අත්සන් උපයෝගී කර ගැනීම හා වංචා වලක්වාලීම සඳහා ප්‍රතිපාදන අන්තර්ගත කර ඇත. ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභාවේ නිර්දේශ ලැබී ඇති අතර ඉතා ඉක්මනින් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට නියමිතය.

**11.** මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත

ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුව මගින් මුස්ලිම් විවාහ සහ දික්කසාද (සංශෝධන) පනත පිළිබඳ සාකච්ඡා කර තවදුරටත් කෙටුම්පත සකස් කරමින් පවතී.

**12.** දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත් කෙටුම්පත

අන්‍යෝන්‍ය කැමැත්ත මත ලිංගික සම්බන්ධතාවයන් පැවැත්වීමෙන් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය යටතේ චෝදනා ලැබූ ගැහැණු හා පිරිමි ළමුන්ට සහනයක් ලබාදීමට මෙමගින් අපේක්ෂා කරයි. මෙහි මූලික කෙටුම්පත සකස් කරමින් පවති. කාන්තා ක්‍රියාකාරකයින් විසින් විරෝධය දක්වා ඇත.

**13.** බන්ධනාගාර පරිපාලන පනත් කෙටුම්පත

මෙම පනත මගින් බන්ධනාගාර සිරකරුවන් පරිපාලනය කිරීමට අවශ්‍ය නව පාලන ක්‍රමයක් සඳහා විධිවධාන සලස්වනු ලබයි. මෙම පනත් කෙටුම්පත බන්ධනාගාර හා පුනුරුත්ථාපන අමාත්‍යවරයා වෙත යොමු කර ඇත.

**14.** **සිවිල් නඩු කටයුතුවලදී දෙමව්පියභාවය පරීක්ෂා කිරීමේ පනත් කෙටුම්පත**

**මෙම පනත් කෙටුම්පත මගින් මාතෘත්වය හා පිතෘත්වය හඳුනා ගැනීමට ජාන පරීක්ෂණය (ඞී.එන්.ඒ) සිදුකිරීම සඳහා විධි විධාන සැලසේ. මෙම කෙටුම්පත ළමයින්ගේ භාරකාරත්වය, නඩත්තු සහ උරුමකාරත්වය වැනි කරුණු සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන සලසයි. පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.**

**15.** **අධිකරණ සංවිධාන (සංශෝධන) පනත (මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව වැඩිකිරීම)**

**අමාත්‍ය මණ්ඩල සංදේශය කැබිනට් මණ්ඩලයට යොමු කිරීමෙන් පසු මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව 92 දක්වා වැඩිකිරීමට නැවත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී.**

**16.** **සිවිල් නඩු විධිවිධාන සංග්‍රහය (අධිකරණ සමථකරණය)**

**සිවිල් නඩු විධාන සංග්‍රහයේ අධිකරණ සමථකරණය සම්බන්ධ මෙම සංශෝධනය ව්‍යවස්ථාකරණය පිළිබඳ කැබිනට් අනුකාරක සභාව විසින් සලකා බලමින් පවතී.**

**17.** **විදේශිය නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම**

**පනත් කෙටුම්පත සලකා බලමින් පවතී.**

**18.** **අධිකරණයට අපහස කිරීමේ පනත් කෙටුම්පත සලකා බලමින් පවතී.**

**19.** **ඡන්ද හිමියන් ලියාපදංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත**

**මෙම පනත සම්මත කර ඇත. (2013 අංක 37)**

## ▪ අනෙකුත් කටයුතු

- **2001 අංක 10 දරණ ජාත්‍යාන්තර ළමා අපහරණ පනත**

**2001 අංක 10 දරණ පනත යටතේ, ළමා අපහරණය පිළිබඳ අයදුම්පත් 38ක් ලැබී ඇත. ඉන් බොහෝමයක්ම නඩු පැවරීමකින් තොරව අවසන් කළ හැකි විය. දැනට මෙම පනත යටතේ මහාධිකරණයේ කටයුතු කෙරෙමින් පවතින්නේ එක් නඩුවක් පමණි. ළමුන් දෙදෙනකු ඕස්ට්‍රේලියාවට සහ ඉතාලියට ගෙන ගොස් ඇති අතර නැවත ශ්‍රී ලංකාවට රැගෙන ඒමට කටයුතු කර ඇත. නෝර්වේ රටට ගෙනයන ලද ළමුන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවට ගෙන ඒමට කටයුතු කළ අතර අධිකරණ තීන්දුවක් මත ඔවුන් නැවත නෝර්වේ රටට යවන ලදී. අයදුම්පත් 02ක් එක්සත් රාජධානියෙන් සහ අයර්ලන්තයෙන් ලැබී ඇති අතර අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.**

- වරදකරුවන් මාරුකිරීම

ශ්‍රී ලංකාව තුලදී වරදක් කර වැරදිකරුවෙකු බවට පත්වූ වෙනත් රටක පුර වැසියෙකු එරටට භාර දීම සහ වෙනත් රටකදී වරදකරුවකු වූ ශ්‍රී ලාංකික පුරවැසියෙකු ශ්‍රී ලංකාවට භාර දීම සම්බන්ධයෙන් මෙම පනත ක්‍රියාත්මකවේ. ඒ අනුව ඉන්දීය වරදකරුවන් 23 දෙනෙකු, පකිස්තානු වරදකරුවන් 50 දෙනෙකු සහ මාලදිවයින් වරදකරුවෙකු එම රටවලට භාරදී ඇත. එක්සත් රාජධානිය තුල වරදකරුවන් වූ ශ්‍රී ලාංකිකයන් 02 දෙනෙකු ඔහුගේ සිර දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවට භාර දී ඇත. නුදුරේදීම තවත් ශ්‍රී ලාංකික සිරකරුවෙකු එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට රැගෙන එනු ඇත. මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික සිරකරුවන් 10 දෙනෙකු රැගෙන ඒම පිළිබඳ සාකච්ඡා කරමින් පවතී.

- ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය

නෛතික අංශයේ විභවතාවයන් සහ නෛතික සේවාවන්හි පවතින වෘත්තීමය ප්‍රමිතීන් සැලකිල්ලට ගනිමින් සමාජමය සේවාවන් හා සම්බන්ධ කලාපීය කේන්ද්‍රස්ථානයක් වශයෙන් රට සංවර්ධනය වීම 2010 අයවැය කථාවේදී හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙම යෝජනාවන් සමග ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය කොළඹ ස්ථාපිත කිරීමට අධිකරණ අමාත්‍යාංශය විසින් තීරණය කරන ලදී.

ජාත්‍යන්තර බේරුම්කරණය යනු අන්තර්ජාතික වාණිජ ගිවිසුම සහ අනිකුත් අන්තර්ජාතික වාණිජ සම්බන්ධතා තුලින් පැනනගින ගැටුම් නිරාකරණය සඳහා වූ ප්‍රමුඛතම ක්‍රමවේදයක් වන අතර එතෙර ජාත්‍යන්තර නඩු කටයුතු වලදී දීර්ඝ කාලීනව එහි ශ්‍රේෂ්ඨත්වය ක්‍රියාවෙහි යොදවා ඇත.

මෙම වැයමේදි අධිකරණ අමාත්‍යාංශයේ භූමිකාව වන්නේ එම මධ්‍යස්ථානය පිහිටුවීමට සහයෝගය ලබාදීමයි. මෙම කාර්යය වෙනුවෙන් රජය රුපියල් මිලියන 100 ක් වෙන් කර ඇත. පරිපාලන ගැටළු සහ මෙම මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධ අනෙකුත් කාරණා පිළිබදව විමසා බැලීම සඳහා උපදේශක වරයෙක් පත්කර ඇත. අන්තර්ජාතික බේරුම්කරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මෙම ආයතනය පහසුකම් සපයන අතර මෙය නවීන තාක්ෂණික පහසුකම් සහිතව ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපිත කරනු ලබයි. මෙමගින් අන්තර්ජාතික බේරුම්කරණ කටයුතු සඳහා මෙන්ම ජාතික මට්ටමෙන් සිදුවන බේරුම්කරණ සඳහාද විවිධ වැඩමුළු සැසි පුහුණු කටයුතු පැවැත්විමටද පහසුකම් සලසනු ඇත.

- විදේශ ගතව සිටින විත්තිකරුවන්ට ශ්‍රී ලංකාවේ උසාවිවලින් නිකුත් කරන සිතාසි භාර දීමේ සේවාව පිළිබඳ කරුණු

2000 අංක 39 දරණ සිවිල් හා වාණිජ කරුණු වලදී අන්‍යෝන්‍ය සහයෝගය පිළිබඳ පනතට අනුව 2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව ශ්‍රී ලංකාවේ උසාවි වලින් නිකුත් කරන

ලද සිතාසි 388ක් පහත දක්වා ඇති පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විවිධ උසාවි වලට භාරදී ඇත.

| රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව | රට | නිකුත් කරන ලද සිතාසි සංඛ්‍යාව |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව | 25 | ඔස්ට්‍රියාව | 02 |
| කැනඩාව | 11 | චීනය | 01 |
| සයිප්‍රසය | 06 | ක්‍රොයේෂියාව | 02 |
| එස්ටෝනියාව | 01 | ප්‍රංශය | 14 |
| ජර්මනිය | 08 | ඉන්දියාව | 19 |
| ඉතාලිය | 78 | ජපානය | 12 |
| ජොර්දානය | 10 | කොරියාව | 05 |
| කුවේටය | 13 | ලෙබනනය | 04 |
| මලයාසියාව | 08 | නවසීලන්තය | 04 |
| ඕමානය | 04 | පකිස්ථානය | 01 |
| කටාර් | 13 | සවුදි අරාබිය | 09 |
| සීෂෙල්ස් | 02 | ස්විට්සර්ලන්තය | 08 |
| ටැන්සානියාව | 01 | එක්සත් ආරාබි එමිර් රාජ්‍ය | 48 |
| එක්සත් රාජධානිය | 56 | ඇමෙරිකා එක්සත් ජනපදය | 19 |
| යුක්රේනය | 01 | වෙනිසියුලාව | 03 |

- අන්‍යොන්‍ය නීති උපකාර

අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යොන්‍ය නීති උපකාර කිරීමේ ගිවිසුමක් ශ්‍රීලංකා රජය හා බෙලරුස් රජය අත්සන් කර ඇත. විමර්ශනය, චෝදනා ඉදිරිපත් කිරීම, නඩු විභාග කිරීම සහ එහි ප්‍රතිඵලය ලෙස ඇති වන නීති කෘත්‍යයන් ඇතුළු සාපරාධි කාරණා වලදී එක් එක් පාර්ෂවය වෙත අන්‍යොන්‍ය නෛතික සහයෝගිතාව ලබා දීමේ අපේක්ෂාවෙන් බෙලරුස් ජන රජය සහ ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මෙම අවබෝධතා ගිවිසුමට එළඹ ඇත. ශ්‍රී ලංකාවට මෙන්ම බෙලරුස් රාජ්‍යයට ද ප්‍රතිලාභ අත්කර දෙන ආකාරයෙන් සහ මෙම රාජ්‍යයන්වල නීති සහ රාජ්‍යයන් දෙක විසින් පිළිගෙන ඇති හෝ අත්සන් කර ඇති ජාත්‍යාන්තර ගිවිසුම් වලට අනුකූල වන ආකාරයෙන්, දෙරටෙහි නීතිමය පද්ධතිය, ආයතන සහ ව්‍යවස්ථා සංවර්ධනය කිරීම ආශ්‍රිතව පවත්නා ගැටළු සම්බන්ධයෙන් නෛතික රාමුවක ස්වරූපයක් ගන්නා සහයෝගීතාවක් ඇති කිරීමට ක්‍රියා කිරීම ශ්‍රී ලංකාවේ රජය හා බෙලරුස් රජය අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුමේ පරමාර්ථය වේ.

මීට අමතරව රුසියාව සමග අපරාධ කරුණු සම්බන්ධයෙන් අන්‍යොන්‍ය නීති උපකාර හා සිරකරුවන් හුවමාරුව සම්බන්ධයෙන් ගිවිසුමක් ඇතිකර ගැනීමේ කටයුතු අවසන් කර ඇත. එමෙන්ම *BIMSTEC රටවල් අතර අන්‍යොන්‍ය නීති උපකාර සම්බන්ධයෙන් ගිවිසුමද ඇතිකරගෙන ඇත.

*The Bay of Bengal Initiative for multi sectrorial Technical and Economic Coperation

- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ සහයෝගිතාව ඇතිව ආරම්භ කරන ලද ළමා ආරක්ෂාව සහ ළමා අධිකරණ පිළිබඳ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා අපයෝජන පිළිබඳ නඩු සම්බන්ධයෙන් ක්‍රියා කර ඒවා විභාග කොට අවසන් කිරීම, කඩිනම් කිරීම සහ ළමා අපයෝජනයට ගොදුරු වුවන් දෙවන

වතාවටත් වින්දිතයින් බවට පත්වීම වැළක්වීමයි. මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ ආයතනවලට නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළත්වේ. අදාළ ළමා අපයෝජන සිද්ධිය පිළිබඳ පැමිණිලි පොලිසියට ඉදිරිපත් කළ දිනයේ සිට වසරකට අඩු කාලයක් ඇතුළත ඊට අදාළ ළමා අපයෝජන නඩු සම්බන්ධයෙන් ක්‍රියාකර, එම නඩු විභාග කොට අවසන් කිරිම කඩිනම් කිරිම මෙම නව ක්‍රියාමාර්ගයෙන් අපේක්ෂා කරනු ලැබේ. එසේම අපරාධයට ගොදුරුවූ ළමා වින්දිතයින් පවතින අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අවතීර්ණ විම නිසා නැවත වතාවක් වින්දිතයින් බවට පත්විම වැළක්විම සාක්ෂාත් කර ගැනිමටද මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කරනු ලැබේ.

අනුරාධපුර, මහනුවර, හම්බන්තොට සහ තංගල්ල ආදී දිස්ත්‍රික්කවල පුහුණු වැඩසටහන් ගණනාවක් මේ වන විටත් පවත්වා ඇත. ඒ සඳහා නිලධාරින් 394ක් (පොලිස් ස්ථානාධිපතිවරු, අපරාධ අංශය භාර පොලිස් ස්ථානාධිපතිවරු, කාන්තා හා ළමා කාර්‍යාංශයේ ස්ථානභාර නිලධාරිවරු සහ මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පවරන නිලධාරිවරු) සහභාගී වී ඇත. නියමු ව්‍යාපෘති ප්‍රදේශවල සිදු වූ ළමා අපයෝජන සිද්ධීන් සම්බන්ධ නඩුවල ප්‍රමාදය අවසන්කිරිම පිණිස පියවර ගණනාවක් ක්‍රියාවට නංවා ඇත. මෙම විෂය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබාගැනිමෙන් පසුව, ළමා (අධිකරණ ආරක්ෂාව ) පිළිබඳ අවසානාත්මක පනත් කෙටුම්පතක් මේ වනවිටත් සකස් කොට අවසන් කරඇත.

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - යුක්තියට සම ප්‍රවේශයක් පිළිබඳ ව්‍යාපෘතිය.

ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ අභියාචනාධිකරණයේ එකරැස්වී ඇති දමිළ බසින් ගොනුකර ඇති අභියාචනා නඩු ගොනු ඉංග්‍රිසි බසට පරිවර්තනය කරදීම පිණිස අධිකරණ අමාත්‍යාංශය මගින් නියමු ව්‍යාපෘතියක් 2013 අගෝස්තු මස ආරම්භ කරන ලදී. මේ සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් අභියාචනාධිකරණයේ විශේෂ පරිවර්තන ඒකකයක් පිහිටුවන ලදි. එකී නියමු ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය 2013 දෙසැම්බර් 31 දිනට අවසන් විය. ව්‍යාපෘතිය අවසානයේ දි නඩු වාර්තා 30ම පරිවර්තනය කොට අවසන් වූ අතර, 2014 වසරේ මුල් භාගය තුලදී ඒවා විභාගකොට තීරණයක් කිරීම සඳහා අභියාචනාධිකරණය වෙත යොමු කොට ඇත. 2014 වසරේදී මෙම ව්‍යාපෘතිය අධිකරණ අමාත්‍යාංශය යටතේ ප්‍රධාන ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වීමට නියමිතය.

- අධිකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය.

අධිකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය www.justiceministry.gov.lk

## 5.2 පාලන හා ආයතන අංශය

අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන සඳහා ප්‍රශස්ථ මෙන්ම පුහුණු මානව සම්පත් ලබා දීම සහතික කිරීම ආයතන හා පාලන අංශයේ ප්‍රධාන අරමුණ වේ. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම, තෝරා ගැනීම සහ බඳවා ගැනීම, පුහුණු කිරීම, ස්ථාන මාරුකිරීම, උසස් කිරීම හා විනය කටයුතු මෙම අංශයෙන් ඉටු කරනු ලබයි. මේ යටතේ අධිකරණ අමාත්‍යාංශයේ ඍජු පාලනයට යටත්වන කාර්ය මණ්ඩලයේ 215 කගේ සහ දිවයින පුරා අධිකරණවල සේවය කරන  කාර්ය මණ්ඩලය 3697 ක ගේ පරිපාලන කටයුතු මෙම අංශයෙන් ඉටුවේ.

මීට අමතරව ඉහත සඳහන් සියලු ආයතනවල සේවකයින්ගේ ණය හා අත්තිකාරම්, අධිකරණ මගින් රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම, රජයේ නිලධාරින් ගේ ඇප අනුමත කිරීමද මෙම අංශයෙන් ඉටුවේ.

තවද, හදිසි මරණ පරීක්ෂකවරුන්, සාමවිනිසුරුවරුන් හා නිල නොලත් මහෙස්ත්‍රාත්වරුන්, දිවුරුම් කොමසාරිස්වරුන්, දිවුරුම්දුන් භාෂා පරිවර්තකයින් පත් කිරීම සඳහා අදාල නිර්දේශ ලබාදීමද මෙම අංශයෙන් ඉටුකරනු ලබයි.

2013.01.01 සිට 2013.12.31 දින දක්වා කාලය තුළ මෙම අංශයෙන් ඉටු කරන ලද සේවාවන් පහත පරිදිවේ.

- තනතුරු ඇති කිරීම

මුදල් රෙගුලාසි 71 යටතේ ඉහත කාලපරිච්ඡේදයට අදාලව අලුතින් ඇති කරන ලද තනතුරු පහත පරිදි වේ.

| ආයතනය | මාණ්ඩලික ශ්‍රේණිය | සමාන්තර සේවා | කණිෂ්ඨ සේවක | එකතුව |
|---|---|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | _ | 42 | _ | 42 |
| අධිකරණ | _ | 618 | _ | 618 |
| රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | _ | 06 | _ | 06 |
| නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | _ | 04 | _ | 04 |
| ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | _ | 02 | _ | 02 |
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | _ | 15 | 01 | 16 |
| අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු ආයතනය | 01 | 03 | 03 | 07 |
| විනිසුරු පුහුණු ආයතනය | 06 | 09 | 06 | 21 |
| මුළු එකතුව | | | | 716 |

- බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සහ බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරවා ගැනීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා මෙම කාලය තුළ බඳවා ගැනීම් පටිපාටි 12 ක් ඉදිරිපත් කර ඇත.

බඳවා ගැනීමේ පටිපාටි 08 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

## ▪ බඳවා ගැනීම සහ පත් කිරීම

- බඳවා ගැනීම

| ආයතනය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| අධිකරණ අමාත්‍යාංශය | සහකාර ලේකම් (නීති) | 01 |
| | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරීන් | 14 |
| | රියදුරු තනතුරු | 04 |
| | සංවර්ධන නිලධාරි | 11 |
| | පිළිගැනීමේ නිළධාරි | 02 |
| | සංචාරක බංගලා භාරකරු | 01 |
| | කැමරා ක්‍රියාකරු සහයක (තාවකාලික) | 01 |
| අධිකරණ අමාත්‍යාංශය (අධිකරණ සඳහා) | සංවර්ධන නිලධාරි | 247 |
| | අභ්‍යාසලාභී උපාධිධාරි | 50 |
| | අධිකරණ ආරක්ෂක | 110 |
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය | ලඝු ලේඛක | 29 |
| | රියදුරු | 02 |
| රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | අභ්‍යාසලාභී උපාධිධාරි | 02 |
| ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | අභ්‍යාසලාභී උපාධිධාරි | 01 |
| සමථ මණ්ඩල කොමිෂන් සභාව | අභ්‍යාසලාභී උපාධිධාරි | 12 |

- පත් කිරීම්

ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරන ලද පත් කිරීම් සහ නිර්දේශයන් පහත පරිදි වේ.

| තනතුර | පත්කිරීම් සංඛ්‍යාව |
|---|---|
| දිවුරුම් කොමසාරිස් | 661 |
| හදිසි මරණ පරීක්ෂක | 11 |
| සාමවිනිසුරු හා නිල නොලත් මහේස්ත්‍රාත් | 85 |
| සාම විනිසුරු | 4143 |
| *දිවුරුම් දුන් භාෂා පරිවර්තක | 189 |

*දිවුරුම් දුන් භාෂා පරිවර්තකවරුන් නිර්දේශ කිරීම සඳහා

| පැවැත්වූ විභාග සංඛ්‍යාව | | පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|
| දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමේ විභාගය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන් සඳහා) | 03 | 647 |
| දිවුරුම් දුන් භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමේ විභාගය (අරාබි භාෂාව සඳහා) | 01 | 16 |

- පුහුණු කිරීම්

▪ දේශීය

| පුහුණුවේ ස්වභාවය | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| විෂයානු බද්ධ | 33 |
| පරිගණක | 04 |
| පුස්තකාල ඩිප්ලෝමාව | 01 |
| භාෂා දැනුම<br>ඉංග්‍රිසි භාෂාව<br>දෙමළ භාෂාව | <br>06<br>80 |
| මානව හිමිකම් ඩිප්ලෝමාව | 25 |
| ව්‍යාපෘති කළමනාකරණය | 50 |
| සම්මන්ත්‍රණ | 02 |
| සේවාස්ථ පුහුණු ( සිතාසි බෙදන්නා සහ ඇස්කිසි ක්‍රියාත්මක කරන්නා ) | 36 |

▪ විදේශීය

| පුහුණුවේ ස්වභාවය | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| පුහුණු (විනිසුරුවරුන් ඇතුළුව ) | 63 |
| සම්මන්ත්‍රණ | 18 |

- ණය අනුමත කිරිම

| ණය අනුමත කිරීම් | | |
|---|---|---|
| ණය වර්ගය | සංඛ්‍යාව | මුදල (රු) |
| දේපළ / නිවාස ණය | 57 | 82,062,088.20 |
| වාහන ණය | 01 | - |
| ආපදා ණය | 129 | 9,600,942.00 |
| උත්සව අත්තිකාරම් | 161 | 815,000.00 |
| විශේෂ අත්තිකාරම් | 34 | 85.000.00 |
| පාපැදි ණය | 05 | 30.000.00 |

▪ වෙන්දේසි කිරීම

| වෙන්දේසි සංඛ්‍යාව | ආදයම (රු) |
|---|---|
| 150 | 42,320,162.00 |

- විනිසුරුවරුන්ගේ සුව සම්පත රක්ෂණ ක්‍රමය

| රක්ෂණ ක්‍රමයට බඳවාගෙන ඇති විනිසුරුවන් සංඛ්‍යාව | වැය කර ඇති මුදල (රු) |
|---|---|
| **240** | **5,670,119.90** |

- නිල රථ රක්ෂණය කිරීම

| ආයතනය | නිල රථ සංඛ්‍යාව | | මුදල (රු) |
|---|---|---|---|
| අමාත්‍ය කාර්ය මණ්ඩලය | **10** | **(පූර්ණ)** | **1,079,362.07** |
| අධිකරණ නිලධාරීන්ගේ නිල රථ | **158** | **(පූර්ණ)** | **8,436,208.95** |
| | **02** | **(තුන්වන පාර්ශව)** | **2,316.56** |
| අමාත්‍යාංශයේ නිල රථ | **20** | **(පූර්ණ)** | **722,372.81** |
| | **08** | **(තුන්වන පාර්ශව)** | **11,235.35** |

- වෙනත් කාර්යයන්

- **2013 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පොළොන්නරුව, ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි අධිකරණ අතර පවත්වන ලද ඵලදායිතා සම්මාන තරඟාවලියේ හොඳම අධිකරණ සඳහා ත්‍යාග සහ සහතික ප්‍රදානය කිරීම.**

- **2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව, ඵලදායිතා සංකල්පය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් කෑගල්ල , පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල පැවැත්වීම.**

- **2013/2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව අම්පාර, කල්මුණ, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, කෑගල්ල, හලාවත හා පුත්තලම යන අධිකරණ කලාප වලට අයත් අධිකරණ ආවරණය වන පරිදි පවත්වන ලද ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණවත් නොවන බව පෙනීගිය බැවින් ඉහත සඳහන් අධිකරණ සියල්ල ආවරණය වන පරිදි එම නිළධාරීන් සඳහා බත්තරමුල්ලේ පිහිටි අධිකරණ නොවන නිලධාරීන්ගේ පුහුණු ආයතනයේ දී දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.**

- **අධිකරණ 93 ක් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම.**

## 5.3 යටිතල පහසුකම් අංශය

අධිකරණ අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශය මගින් අධිකරණ පද්ධතිය සඳහා අවශ්‍ය නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කටයුතු මෙන්ම ඉඩම් පවරා ගැනීම වැනි වැදගත් කාර්යභාරයන් රාශියක් ඉටු කරනු ලබයි.

ඉදිකිරීම් අවසන් කර ඇති ප්‍රධාන ව්‍යාපෘති





**01.**මීගමුව නව අධිකරණ සංකීර්ණය 2013 වර්ෂයේදී මහජන අයිතියට පවරන ලදී.





**02.**මල්ලාකම් නව අධිකරණ ගොඩනැගිල්ල සහ විනිසුරු නිල නිවස
(ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් ඉදිකරන ලදී)





**03.**චාවකච්චේරි අධිකරණ ගොඩනැගිල්ල සහ විනිසුරු නිල නිවාසය
(ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් ඉදිකරන ලදී)





04. කයිට්ස් අධිකරණ ගොඩනැගිල්ල සහ විනිසුරු නිල නිවාසය
(ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් ඉදිකරන ලදී)
05. කොටපොල නව අධිකරණ සංකීර්ණය
06. කුලියාපිටිය නව මහාධිකරණ ගොඩනැගිල්ල
07. තඹුත්තේගම නව දිසා / මහේස්ත්‍රාත් අධිකරණය
08. මනම්පිටිය නව සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය
09. බකමූණ නව සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය
10. පොතුවිල් දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
11. ඔට්ටමාවඩි කාති උසාවිය
12. ඉරක්කාමම් කාති උසාවිය
13. හොරණ අධිකරණ සංකීර්ණය (විදුලි සෝපානය)
14. අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය ලේඛණාගාරය සහ නඩුභාණ්ඩ කාමරය
15. අක්කරේපත්තුව දිසා අධිකරණය
16. හොරොම්බාව කාති උසාවිය
17. අධිකරණ අමාත්‍යාංශයේ ගරාජය හා ගබඩා ගොඩනැගිල්ල
18. මාතලේ කාති උසාවිය
19. පොතුවිල් කාති උසාවිය

2013 වර්ෂයේ අලුතින් ආරම්භ කල ව්‍යාපෘති

1. කල්පිටිය සංචාරක මහේස්ත්රාත් අධිකරණය
2. කැකිරාව දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ ලේඛණාගාරය සහ නඩු භාණ්ඩ කාමරය
3. සමන්තුරේ මහේස්ත්‍රාත් අධිකරණය
4. නොච්චියාගම සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය
5. උඩුගම මහේස්ත්‍රාත් අධිකරණ ලේඛණාගාරය සහ නඩුභාණ්ඩ කාමරය
6. නුවරඑළිය දිසා විනිසුරු නිල නිවාසය
7. වෙල්ලමනල් කාති උසාවිය
8. පෙරියමඩු - මාන්තෙයි කාති උසාවිය
9. කුරුණෑගල කාති උසාවිය
10. බිබිල නව අධිකරණ ගොඩනැගිල්ල

11. පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාලය

12. මඩකලපුව අධිකරණ සංකීර්ණය

13. නාවුල මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාල ගොඩනැගිල්ල




14. උපරිමාධිකරණ සංකිර්ණය අළුත්වැඩියාව

**2013 වර්ෂයේ ආරම්භ කරන ලද මහා පරිමාණ ව්‍යාපෘති**




01. හෝමාගම ඉදිකිරීමට යෝජිත අධිකරණ සංකීර්ණය




02. ගාල්ල ඉදිකිරීමට යෝජිත අධිකරණ සංකීර්ණය



**03.**වැලිසර අධිකරණ සංකීර්ණය (වත්තල)

**2014** වර්ෂයේ ආරම්භ කිරිමට යෝජිත නව ව්‍යාපෘති

- මුත්තුර් දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
- ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණ කාර්යාලය හා ලේඛනාගාරය ඉදිකිරිම
- හිඟුරක්ගොඩ දිසා මහේස්ත්‍රාත් අධිකරණ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
- කොළඹ ප්‍රධාන මහේස්ත්‍රත් අධිකරණයේ සිර මැදිරිය සහ පොලිස් මුරපොළ ඉදිකිරිම
- පුත්තලම මහාධිකරණ විනිසුරු නිල නිවස ඉදිකිරීම
- කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
- දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණය අලුත් වැඩියාව
- වරකාපොළ දිසා විනිසුරු නිලනිවස අලුත් වැඩියාව
- තංගල්ල අතිරේක දිසා විනිසුරු නිල නිවස අලුත්වැඩියාව
- නිකවැරටිය දිසා මහේස්ත්‍රාත් අධිකරණ ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය ඉදිකිරීම
- කෑගල්ල අතිරේක දිසා විනිසුරු නිල නිවස අලුත්වැඩියාව
- මාතර දිසා විනිසුරු නිල නිවස අලුත් වැඩියාව
- පොළොන්නරුව මහාධිකරණ විනිසුරු නිල නිවස අලුත්වැඩියාව
- බිබිල මහාධිකරණ විනිසුරු නිල නිවස අලුත්වැඩියාව

## 5.3 ගිණුම් අංශය

අධිකරණ අමාත්‍යාංශයේ ගිණුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශ පාලන හා අධිකරණ පාලන වැය ශීර්ෂයන් යටතේ පහත සඳහන් පරිදි ගිණුම් විධිමත් කිරීමේ කටයුතු 2013 වර්ෂයේ ආරම්භ කර ඇත.

මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් පහත ආකාරයෙන් ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ.

1. ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
2. අමාත්‍යාංශ පරිපාලනය
3. අධිකරණ පරිපාලනය
4. සමථ මණ්ඩල කොමිෂන් සභාව
5. නීති ආධාර කොමිෂන් සභාව / ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය

**2013.01.01 සිට 2013 .12 .31 දක්වා ප්‍රගතිය**

අමාත්‍යාංශ පරිපාලන ශීර්ෂ 110 - 1, 2 , 3

| විස්තරය | ඇස්තමේන්තුව (රුපියල්) | වියදම (රුපියල්) | ප්‍රගතිය ( % ) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 508,104,690 | 497,822,659 | 98% |
| ප්‍රග්ධන වියදම් | 301,195,310 | 293,050,685 | 97% |
| මුළු එකතුව | 809,300,000 | 790,873,344 | 98% |

අධිකරණ පරිපාලන 228 - 1, 2

| විස්තරය | ඇස්තමේන්තුව (රුපියල්) | වියදම (රුපියල්) | ප්‍රගතිය ( % ) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 3,775,168,625 | 3,761,324,328 | 99% |
| ප්‍රග්ධන වියදම් | 1,020,740,000 | 910,573,419 | 89% |
| මුළු එකතුව | 4,795,908,625 | 4,671,897,747 | 97% |

## 5.5 සැලසුම් අංශය

සැලසුම් අංශය මගින් අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන වලට අදාලව සැලසුම් කිරීම, ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු මෙන්ම පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- අමාත්‍යාංශය සඳහා වාර්ෂික මූලධන අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ඊට අදාල ත්‍රෛයිමාසික ප්‍රගතිය සකස් කිරීම සහ අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කිරීම.
- ප්‍රගති වාර්තාව පිළියෙල කිරීම. (ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම)
- නඩු සම්බන්ධ සංඛ්‍යා ලේඛන රැස් කිරීම.
- නඩු පිළිබඳ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම.
- ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ලබා ගැනීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික විගණන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.
- අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන සහ පසු විපරම් කටයුතු සිදුකිරිම.
- අධිකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය කිරීම.
- දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටිය සකස් කිරීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

## 5.6 අධිකරණ නොවන නිලධාරින්ගේ පුහුණු මධ්‍යස්ථානය

අධිකරණවල සේවය කරන අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීම අරමුණුකර ගනිමින් 2010 වර්ෂයේ බත්තරමුල්ල - පැලවත්තේ පිහිටි අධිකරණ ගොඩනැගිල්ලහි මෙම අංශය ස්ථාපිත කරන ලදී. මෙම ආයතනය මගින් මේ වන විට අධිකරණ ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකරන නිලධාරින් සහ සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් පහත අරමුණු මුල්කර ගනිමින් පවත්වා ඇත.

01. ආකල්ප හා විනය සංවර්ධනය
02. රාජකාරිය පිළිබඳ අවබෝධය
03. නව්‍යකරණය හා නිර්මාණකරණය
04. අල්ලස හා දූෂණය මැඩලීම

**2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වා ඇත.**

| අංකය | පුහුණු වැඩයටහන | වැඩසටහන් පැවැත්වූ ගණන | පුහුණුවූ පුහුණුලාභීන් ගණන | පුහුණුලාභීන් සහභාගි කර වූ අධිකරණ කලාපයන් |
|---|---|---|---|---|
| 01 | සිතාසි බෙදන්නන් හා ඇස්කිසි ක්‍රියාත්මක කරන නිලධාරින් | 12 | 181 | කොළඹ,කළුතර,ගම්පහ, කුරුණෑගල, පුත්තලම,කෑගල්ල සහ තංගල්ල |
| 02 | අධිකරණ ලිපිකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 10 | 211 | කොළඹ, කළුතර, ගම්පහ, හලාවත කුරුණෑගල ,පුත්තලම සහ කෑගල්ල |
| 03 | දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව ඵලදායිතා සංකල්පය පිළිබඳ දැනුවත් කිරිමේ වැඩසටහන | 04 | 107 | කුරුණෑගල, පුත්තලම, කෑගල්ල, අම්පාර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ කල්මුණ |
| 04 | නායකත්ව පුහුණු වැඩසටහන | 02 | 53 | අධිකරණ අමාත්‍යාංශයිය නිලධාරින් |

## 5.7 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු, උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය, විනිසුරු පුහුණු ආයතනය සහ නීති ආධාර කොමිෂන් සභාව යන ව්‍යවස්ථාපිත ආයතන තුනත්, අමාත්‍යංශ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන සමථ මණ්ඩල කොමිෂන් සභාවත් අධිකරණ පරිපාලන වැය විෂයේ සහායක ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වන කම්කරු විනිශ්වය සභා ලේකම් කාර්යාලයත් අධිකරණ පරිපාලන වැය ශීර්ෂය යටතේ වන මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය කටයුතු කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන), මූල්‍ය සහකාර නිලධාරින් 06 ක්, සංවර්ධන නිලධාරින් 06ක්, සහ කළමණාකාරණ සහකාර නිලධාරින් 5 දෙනෙකුගෙන් සමන්විත වේ.

මෙම නිලධාරින් ක්‍රම විගණනය කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව ඉහත සඳහන් ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබන අතර 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා මහාධිකරණ 15ක්, දිසා/මහේස්ත්‍රාත් අධිකරණ 16ක්, දිසා අධිකරණ 09ක්, මහේස්ත්‍රාත් අධිකරණ 15ක්, කම්කරු විනිශ්වය සභා 02ක්, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන 10 ක් සහ විශේෂ විමර්ශන 01ක් ආදි වශයෙන් සම්පූර්ණ විගණන පරීක්ෂණ 70ක් සිදුකර ඇත.

# 05. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල ප්‍රගතිය

## 6.1 රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා රසායනාගාරය වේ. මෙය සේවාවන් සඳහා වෙන්වූ දෙපාර්තමේන්තුවක් වන අතර උසාවි, පොලිස්, රේගුව, සුරාබදු, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය, වරාය, වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂණයන්ට ලක් කිරීම සහ ඒවා පිළිබඳ වාර්තා නිකුත් කිරීම කරනු ලැබේ. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආදර්ශ තත්ව පාලන කටයුතු පිළිබඳ පරීක්ෂා කරනු ලබන අතර ශ්‍රී ලංකා රේගුව යොමු කරන ආදර්ශ තත්ත්ව පාලන කටයුතු සහ තීරු බදු වර්ගීකරණය යන කරුණු දෙකම උදෙසා පරීක්ෂා කරනු ලබයි. තවද අධිකරණ මගින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛන පරීක්ෂා කිරීම හා වාර්තා කිරීමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත , සුරාබදු ආඥා පනත , දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත , සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පලිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිනි අවි ආඥා පනත, පුපුරන ද්‍රව්‍ය පනත, විෂවර්ග, අබිං සහ අන්තරායකාර ඖෂධ පනත, තහනම් පිහි පනත, මොටර් වාහන පනත, අපාරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි අඥාපනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.

මෙවැනි සේවා සැපයීමට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ සිටින විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විද්‍යාඥයින් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදු කරයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ මිලදී ගැනීම් වලදි තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරින් විසින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුව 2013 වර්ෂයේ මැයි මස බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ නවීන විද්‍යාත්මක උපකරණ හා සියළු පහසුකම් වලින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

අධිකරණ විද්‍යා අංශයට අත්‍යාවශයව තිබූ ඩී.එන්.ඒ. රසායනාගාරයකට අවශ්‍ය සියලු උපකරණ සහිතව මෙම පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු එහි ආරම්භකර ඇත. තවද මෙම දෙපාර්තමේන්තුවේ පළාත් රසායනාගාරයක්ද කුරුණෑගල ඉදිකර ඇත.

**2013 .01. 01 සිට 2013. 12.31 දක්වා ප්‍රගතිය**

| අංශය | 2013.01.01 දින ඉතිරි නඩු සංඛ්‍යාව | 2013.01.01සිට 2013.12.31 දක්වා දිනට ලැබී ඇති නඩු සංඛ්‍යාව | 2013.01.01සිට 2013.12.31 දක්වා වාර්තා කල නඩු සංඛ්‍යාව | 2013.12.31 දක්වා වාර්තා නොකල නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය අංශය | 1,448 | 6,182 | 6,955 | 675 |
| ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය | 1,437 | 374 | 995 | 816 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය | 805 | 292 | 567 | 530 |
| අධිකරණ ධූලක විද්‍යා අංශය | 3,065 | 1,620 | 2,288 | 2,397 |
| අධිකරණ මස්තු විද්‍යා අංශය | 1,775 | 495 | 869 | 1,401 |
| සැක කටයුතු ලේඛණ අංශය | 561 | 710 | 701 | 570 |
| අධිකරණ විද්‍යා විවිධ අංශය | 388 | 328 | 485 | 231 |
| ප්‍රධාන කාර්යාලය (මත්පැන්) | 63 | 2,335 | 2,281 | 117 |
| මධ්‍යසාර හා දුම්කොළ | 119 | 1,309 | 1,316 | 112 |
| කුරුණෑගල (මත්පැන්) | 4,353 | 3,342 | 7,132 | 563 |
| ආහාර පනත යටතේ ආහාර සම්පල | 837 | 4,165 | 4,473 | 529 |
| විවධ ආහාර | 22 | 577 | 561 | 38 |
| එකතුව | **14,873** | **21,729** | **28,623** | **7,979** |

- විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පියවර රාශියක් ගැනීමෙන් ප්‍රමාද වී තිබූ වාර්තා වසරක් තුල අවසන් කිරීමට කටයුතු කර ඇත.
- මේ වන විට දෙපාර්තමේන්තුවට අවශ්‍ය විද්‍යාඥ පිරිස 79 දක්වා ඉහල නංවා ඇති අතර එයින් 95% පමණ පුරප්පාඩු මේ වන විටත් පුරවා තිබේ. ඉතිරි පුරප්පාඩු පිරවීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදුකර ඇත.

- නඩු භාණ්ඩ විශ්ලේෂණය කිරීමේ කාර්ය සඳහා නව ක්‍රමවේද හඳුන්වා දී ඇත.

**2013.01.01 සිට 2013 .12 .31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) 2013-12-31 දිනට | ප්‍රගතිය% |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | **135,363,426** | **134,032,378** | **99%** |
| ප්‍රාග්ධන වියදම | **237,193,000** | **201,543,798** | **85%** |
| එකතුව | **372,556,426** | **335,576,176** | **90%** |

## 6.2 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව 1969 අංක 03 දරණ නීති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලදී. නීති ප්‍රතිසංස්කරණයෙහි නියැලි ප්‍රධානතම රජයේ ආයතනය නීති කොමිෂන් සභාව වන අතර ඒ සඳහා අවශ්‍ය පරිපාලනමය හා පර්යේෂණාත්මක සහයෝගය මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ.

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම නීති කොමිෂන් සභා දෙපාර්තුමේන්තුවේ ප්‍රධාන අරමුණයි. ඉහත කාර්ය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

I. නීතිය සංග්‍රහ ගත කිරීම
II. නීතියේ විෂමතා නැති කිරීම
III. හරයාත්මක නීතිය හා කාර්ය පටිපාටික නීතිය ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම හා පවත්වාගෙනයාම
IV. අභාවයට ගිය හා අනවශ්‍ය පනත් ඉවත් කිරීම
V. නීතිය සරල කිරීම හා නවීකරණය කිරීම
VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා භාරගෙන සලකා බැලීම
VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම
VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව අධ්‍යයනය කොට තොරතුරු ලබාගැනීම.

**2013.01.01 සිට 2013.12.31 දක්වා ප්‍රගතිය**

2013.01.01 සිට 2013.12.31 දක්වා කාල පරිච්ඡේදය තුල නීති කොමිෂන් සභාව විසින් පහත නීතිවලට අදාලව ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

01. ස්ත්‍රී දූෂණ කාරණා වලදී හා බරපතල භ්‍රෑණ හානි අවස්ථාවලදී ගැබ් ගැනීම වෛද්‍ය විද්‍යාත්මකව අවසාන කිරීමට සැලැස්වීම පිණිස වූ යෝජනාව (වෛද්‍ය විද්‍යාත්මකව ගැබ් ගැනීම අවසන්කිරීම (විශේෂ වධිවිධාන ) පනත් කෙටුම්පත)

02. ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කළ නොහැකි තැගි ඔප්පු ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම (විශේෂ විධිවිධාන ) පනත් කෙටුම්පත

2014 වර්ෂය සඳහා සැලසුම්

01. ඉඩම් අත්පත් කර ගැනීම අධ්‍යනය සහ ඒ ආශ්‍රිත ව්‍යවස්ථාකරණය
02. නඩු තීන්දු වලින් පසුව ඉඩම් පැවරීම, ප්‍රදානය කිරීම සහ අන්සතු කිරීම සම්බන්ධව මූලධර්ම පරීක්ෂාව
03. නීති ප්‍රමාද සම්බන්ධයෙන් කාර්ය පටිපාටික නීතිය සමාලෝචනය කිරීම.
04. ඵලදායී ලෙස යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ආඥාක්‍රම ව්‍යවස්ථාමය සහ නීතියේ අනෙකුත් විධිවිධාන අධ්‍යනය කිරීම.

2013.01.01 සිට 2013.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2013 සඳහා ඇස්තමේන්තුව (රු) | 2013. 12 .31 දිනට වියදම (රු) | ප්‍රගතිය % |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 13,800,000 | 11,534,872 | 84% |
| ප්‍රාග්ධන වියදම | 2,500,000 | 2,177,392 | 87% |
| එකතුව | 16,300,000 | 13,712,264 | 84% |

## 6.3 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

1941 අංක 39 දරණ ණය සහනදායක අඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. මෙහි ප්‍රධාන අරමුණ ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු මත, හෝ උගස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සහ පොරොන්දු නෝට්ටු, චෙක්පත් වැනි ලියවිලි මත, ලබා ගත් ණය සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාව එයින් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම වෙයි.

### අරමුණ

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි වූ අයවිය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

මීට අමතරව 1999 අංක 29 දරන පනත මගින් කරන ලද සංශෝධන ට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වි සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායි ක්‍රියා මාර්ගය තවත් පුළුල්වි ඇත.

මෙම මණ්ඩලය අමාත්‍යවරයා පත් කරනු ලබන සමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් සමාජිකයෙකු මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි.

මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් වන බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාවට මෙමගින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් එයින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

මෙම මණ්ඩලයේ රාජකාරී කටයුතු සමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේදි එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළඹෙන ගිවිසුම් මිස ණය සහන දායක මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවෙයි. එසේ වුවද අසාධාරණ පොලී ප්‍රමාණයන් අඩු කිරිමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණය කරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කල නොතීසිය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒක පාක්ෂික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කරනු ලබයි.

### 2013. 01 .01 සිට 2013 .12. 31 දක්වා ප්‍රගතිය

| | |
|---|---|
| ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව ( 2013.01.01) | 533 |
| නව ඉල්ලුම්පත් සංඛ්‍යාව | 453 |
| සමාලෝචනය සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 31 |
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව (2013.12.31 දින වන විට) | 1017 |
| සමථයට පත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 133 |
| නිෂ්ප්‍රභා කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 157 |
| සමාලෝචනය කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | 20 |
| සහතික නිකුත් කල ඉල්ලුම්පත් සංඛ්‍යාව | 03 |
| ඉල්ලා අස්කර ගත් ඉල්ලුම් පත් සංඛ්‍යාව | 19 |
| පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 332 |
| 2013.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 685 |

### 2013.01.01 සිට 2013.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු) | වියදම (රු) | කාර්ය සාධනය ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 9,635,000 | 7,458,933 | 77% |
| ප්‍රාග්ධන වියදම් | 765,000 | 717,593 | 94% |
| එකතුව | 10,400,000 | 8,176,526 | 79% |

### 6.4 ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ( LAC )

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් ස්ථාපිත කරන ලදි. දරිද්‍රතාව නිසා යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට නොහැකි වූ ශ්‍රී ලංකාවේ දුගී ජන කොටස් සඳහා නීති ආධාර සැපයීම මෙහි ප්‍රධාන අරමුණ වේ. අඩු අදායම්ලාභී ජනතාවට නොමිලේ නීතිඥ සහාය හා නීති උපදේශ ලබාදීමත් සමස්ථ සමාජයම නීතිය පිළිබඳව දැනුවත් කිරීමත් කොමිෂන් සභාවේ කාර්යභාරය වේ. මේ වසර තුළ දී පහත සඳහන් අංශ යටතේ වැඩසටහන් ගණනාවක්ම පවත්වා ඇත.

- නීති අංශය - යුක්තියේ පිළිසරණ ලබා ගැනිමට හැකියාවක් නොමැති තැනැත්තන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.

සෘජුව ප්‍රධාන කාර්යාලය යටතේ ක්‍රියාත්මක කොළඹ නීති ආධාර මධ්‍යස්ථානය ඇතුළුව නිති ආධාර මධාස්ථාන 76 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. නඩු කටයුතු වලදී අවශ්‍ය නීති ආධාර සැපයීම නිති ආධාර මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණවේ. මාසික ආදායම රුපියල් 15000 /= හෝ ඊට අඩු තැනැත්තන් සඳහා නීති අධාර ලබාදෙයි. නමුත් විශේෂ තත්වයන් යටතේ ආදායම් තත්වය නොසලකා නීතිඥ නියෝජනය ලබාදෙයි. උදාහරණ වශයෙන් තමන් සඳහා සහ දරුවන් සඳහා ගාස්තු ලබාගැනීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා ආදායම් මට්ටම නොසලකා නීතිඥ නියෝජනය ලබාදෙයි.

නීති ආධාර කොමිෂන් සභාව මගින් සේවා සපයන ලද නඩු පිළිබඳ විස්තර.

| නඩු පිළිබඳ විස්තරය | නඩු ප්‍රමාණය |
|---|---|
| 2012 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද නඩු සංඛ්‍යාව | 27,351 |
| 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අලුතින් එකතු වූ නඩු සංඛ්‍යාව | 9,135 |
| 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අවසන් කරන ලද සංඛ්‍යාව | 4,932 |
| ඉදිරි වර්ෂයට ගෙන යන ලද නඩු සංඛ්‍යාව | 31,554 |
| 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නීති ආධාර කොමිෂන් සභාවේ සේවය ලබාගත් සේවාදායකයින් සංඛ්‍යාව | 58,346 |

ජනමාධ්‍ය වැඩසටහන්

- රූපවාහානි මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කළ වැඩසටහන්

විවිධ රූපවාහිනි ආයතන වලින් ලැබෙන ආරධනාවන්ට අනුව මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කොමිෂන් සභාවේ නීති කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා මෙවැනි වැඩසටහන් 26 ක් පවත්වා ඇත.

- මහජනතාවගේ නීතිමය ගැටලුවලට පුවත්පත් මගින් පිලිතුරු ලබාදීමේ වැඩසටහන්

පුවත්පත් වල නීති ප්‍රශ්න පිළිතුරු පිටු පලකිරීම, මහජනතාවගේ ගැටළු විසදීම හා මහජනතාවගේ නිතිමය දැනුම වැඩිකිරිම සඳහා නීති ආධාර කොමිෂන් සභාව ගත් තවත් පියවරකි.

| පුවත්පතේ නම | භාෂාව | නීති ආධාර පිටුව පලකරන දිනය |
|---|---|---|
| ඩේලි නිව්ස් | ඉංග්‍රිසි | සෑම සිකුරාදාවකම |
| ලංකාදීප | සිංහල | දෙසතියකට වරක් සෑම අඟහරුවාදාවකම |
| රිවිර | සිංහල | සතිපතා |
| දියණිය | සිංහල | සතිපතා |
| තිනකරණ් | දමිළ | සතිපතා |

- ප්‍රකාශන

නීති ආධාර කොමිෂන් සභාව විසින් 2013 වසරේදී මහජනයා මෙන්ම පොලිස් නිලධාරින්, ග්‍රාම නිලධාරින් වැනි රජයේ නිලධාරින් සඳහා ද වැදගත් වන මාතෘකා පිළිබඳ කුඩා පොත් මුද්‍රණය කොට බෙදාහැරීමට කටයුතු කරන ලදි. එම ප්‍රකාශන සිංහල හා දමිළ යන භාෂා දෙකෙන්ම මුද්‍රණය කරන ලදී. ( සිංහල ප්‍රකාශන ගණන 35000 ක් වූ අතර දමිළ ප්‍රකාශන ගණන 6000 ක් විය.)

• දැනුවත් කිරීමේ සහ ප්‍රවර්ධන වැඩ සටහන්

නීති ආධාර කොමිෂන් සභාව විසින් 2013 වසරේ දී දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ උපදේශන වැඩමුළු 377 ක් දිවයින පුරා පවත්වනු ලැබූ අතර, ඒ සඳහා දිවයින පුරා මහජනතාව රජ්‍ය නිලධාරින්, ශිෂ්‍යයින්, කාන්තාවන්, දරුවන්, ඇතුළු 20334 පිරිසක් සහභාගි විය.

නීති ආධාර කොමිෂන් සභාව විසින් ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් යුක්ති ක්‍රියාදාමයට සම ප්‍රවේශයක් පිළිබඳ ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ වැඩ සටහන් 25ක්ද පවත්වන ලදී. මෙම වැඩසටහන් විශේෂයෙන්ම රටේ අනාරක්ෂිත සමාජ කණ්ඩායම් සඳහා නීතිය පිළිබඳ දැනුම ලබාදීම හා උපකාර කිරීම සඳහා ජුලි 15 සිට ජුලි 21 දක්වා යෙදුන සමාජ ඒකාබද්ධතා සතිය තුළ පවත්වන ලදී

විශේෂ ව්‍යාපෘති

• පරිපූරක නෛතික ව්‍යාපෘති

නීති ආධාර කොමිෂන් සභාව පරිපූරක නිති අධ්‍යයනය සඳහා සහතිකපත් පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව පළමුව 2011 දී නීති ආධාර කොමිෂන් සභාවේ නීතිමය පරිසරයක සේවය කරන කළමනාකරණ සහකාරවරුන් සඳහා හඳුන්වා දෙන ලදි. එහි අරමුණ ඔවුන්ගේ කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව වර්ධනය කිරීමයි. එතැන් සිට මෙම පාඨමාලාව අධිකරණ කාර්යමණ්ඩලය ඇතුළු රජයේ නිලධාරින්ට, රාජ්‍ය භාෂා හා ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරින් සහ පුද්ගලික අංශයේ පුද්ගලයින් දක්වා පුළුල් කරන ලදී. 2013 වසරේදි පස්වන සහ හයවන පරිපූරක නෛතික අධ්‍යාපන පාඨමාලාවන් පවත්වන ලදී.

• සංක්‍රමණික සේවකයින් සම්බන්ධයෙන් තොරතුරු ඒකකය

ගැටළුවලට මුහුණ පෑ සංක්‍රමණික සේවකයින් සඳහා මෙම අංශය විසින් 2013 වසරේදී උපදේශන වැඩසටහන් පවත්වා තිබේ. උපදේශන සේවා ලබා දීමෙන් පසු එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී. සංක්‍රමණික සේවකයින් මුහුන පාන ගැටළු වැටුප් නොගෙවීම, ලිංගික අතවර , විදෙස් රටවලදී සිදුවන සංක්‍රමණික සේවක මරණ, නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම ආදි වශයෙන් වර්ග කරනු ලබයි.

• කාන්තා හා ළමා අයිතිවාසිකම්

නීති ආධාර කොමිෂන් සභාවට අනුබද්ධ කාන්තා සහ ළමා කටයුතු අංශය හා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් නීති ආධාර කොමිෂන් සභාවේ මෙන්ම අමාත්‍යාංශයේද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. දැනට නඩත්තු නඩු සංඛ්‍යාව ඉහළ ගොස් තිබීම නිසා නීති ආධාර කොමිෂන් සභාවේ වැඩි අවධානය කාන්තාවන් හා ළමුන් කෙරෙහි යොමුවී ඇත.

• සිරකරුවන්ගේ අයිතිවාසිකම්

නීති ආධාර අවශ්‍ය කිසියම් සිරකරුවෙකුගේ ළඟම ඥාතියෙකුට ඕනෑම නීති ආධාර මධ්‍යස්ථානයක සහය පැතිමේ හැකියාව ඇත. නිතරම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නඩු, නිති ආධාර කොමිෂන් සභාව වෙත යොමුකරයි.

• හදිසි අනතුරුවලින් විපතට පත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ඒකකය

හදිසි අනතුරු වලින් විපතට පත් තැනැත්තන් සඳහා වන්දි ලබා දිම මෙම අංශයේ ප්‍රධාන අරමුණවේ. වන්දි ලබා ගැනීම සඳහා ඉතා ඉක්මනින් සිවිල් නඩුවක් දිසා අධිකරණයේ පැවරීම ක්‍රියාපටිපාටියයි. වන්දි ලබාගැනීමේ හෝ මුදල් අයකරගැනීමේ නඩුවක් වසර 2 කින් කාලවරෝධය වීම එයට හේතුවයි.

ඒ අතරතුර රක්ෂණ ඔම්බුඞ්ස්මන්වරයාගේ අනුග්‍රහය යටතේ අදාළ රක්ෂණ සමාගම සමග සාකච්ඡා පවත්වනු ලබයි. දිගු අධිකරණ ක්‍රියාමාර්ගයකට නොගොස් සාකච්ඡා මාර්ගයෙන් සමථයකට පත්කිරීම මෙහි අරමුණයි. මේ වන විට එවැනි නඩු ගණනාවක් රක්ෂණ ඔම්බුඞ්ස්මන්වරයාගේ උපදෙස් ලබාදීම යටතේ පවතී. 2013 දෙසැම්බර් 31 වන විට කැකිරාව, හලාවත, ඇඹිලිපිටිය, පානදුර, කොළඹ, හෝමාගම , අවිස්සාවේල්ල යන හදිසි අනතුරුවලින් විපතට පත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ඒකක 8 ක්‍රියාකාරිව ක්‍රියාත්මක විය.

• මානව හිමිකම් කාර්යාංශය

මෙම අංශයෙන් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් රජයේ නිලධාරීන් විසින් කඩකිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීම සිදු කරයි. මේ යටතේ 2013 වසරේදි

මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු 13ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කොට ඇති අතර නඩු දෙකක් අවසන් කර ඇත.

• **UNAIDS සමඟ සම කොටස්කරුවන් වීම**

නීති ආධාර කොමිසමේ නීති නිළධාරියෙකු විසින් එච්. අයි. වී. වෛරසය ආසාධිත වින්දිතයන් සඳහා නීති ආධාර සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ නීති සායනයක් පැවැත්වීමෙන් UNAIDS සමඟ සම කොටස් කරුවන් වීම 2013 වර්ෂයේ දී ආරම්භ විය. එච්. අයි. වී. වෛරසය ආසාධිත වින්ධිතයන් සඳහා මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ පළමු අවස්ථාව මෙය බව පෙනේ.

• වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සඳහා වූ ඒකකය

වැඩිහිටි තැනැත්තන් සමාජයේ බෙහෙවින්ම අනාරක්ෂිත කණ්ඩායමක් වශයෙන් හඳුනා ගැනීමෙන් පසු, නීති ආධාර කොමිෂන් සභාව විසින් වැඩිහිටි තැනැත්තන් ඉලක්කකර ගනිමින් වැඩසටහන් රාශියක් දියත් කරන ලදී. වැඩිහිටි තැනැත්තන් සම්බන්ධ ආරවුල් සමථයකට පත් කිරීමට නොහැකිවූ අවස්ථාවක දී, නීති ආධාර කොමිසම එම ආරවුල වැඩිහිටි තැනැත්තන් නඩත්තු කිරීමේ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

• දැයට කිරුළ

මෙම වැඩසටහන යටතේ නීති ආධාර කොමිෂන් සභාව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

○ නීති ආධාර සායන පැවැත්වීම (සායන 720ක් පවත්වන ලදී.)

○ දැනුවත් කිරීමේ බැනර්, පෝස්ටර්, පුවරු, ප්‍රදර්ශනය

○ දැනුවත් කිරීමේ පොත්, අත්පත්‍රිකා නොමිලයේ බෙදා හැරිම

○ නීති ආධාර කොමිෂන් සභාව විසින් ප්‍රකාශකරන ලද පොත් අළෙවි කිරීම

○ පොත් අලෙවි කරන විට නීතිය පිළිබඳ දැනුවත් කිරීම (සරල උපදේශනය)

**2013.01.01 සිට 2013.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තර | මුදල් වෙන් කිරීම (රු) | වියදම් (රු) | කාර්ය සාධනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **116,500,000** | **116,500,000** | **100%** |
| ප්‍රාග්ධන වියදම් | **19,700,000** | **19,655,237** | **99%** |
| මුළු වියදම් | **136,200,000** | **136,155,237** | **99.9%** |

## 6.5 සමථ මණ්ඩල කොමිෂන් සභාව

1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මගින් සමථ මණ්ඩල කොමිෂන් සභාව පිහිටුවන ලදී. ඒ යටතේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සඳහාම සමථ මණ්ඩල පිහිටුවීම ආරම්භ කරන ලදි. මෙය අධිකරණ ක්‍රියාවලිය පහසු කරලීමේ අරමුණින් ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමවේදයක් ලෙස අධිකරණය වෙත ඉදිරිපත් වන ආරවුල්වලින් සුළු ආරවුල් විසඳාලීම උදෙසා සකස් කරන ලද ඉතා වටිනා වැඩපිළිවෙලක් ලෙස හඳුන්වා දිය හැකිය. මේ වන විට ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 326 ක පිහිටුවා ඇති සමථ මූල මණ්ඩලවල සමථකරුවන් 7900 කට අධික පිරිසක් ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබයි.

සමථ මණ්ඩල කොමිෂන් සභාව සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් පත්කිරීමේ බලය අතිගරු ජනාධිපතිතුමා සතුවෙයි. පනතේ සඳහන් පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සමාජිකයින් පස්දෙනාගෙන් තිදෙනෙකු උපරිමාධිකරණවල විශ්‍රාමික විනිශ්චයකාරවරුන් විය යුතුය. සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථකාරවරුන් පත් කිරීම, මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය වැනි සමථ මුල මණ්ඩලට අදාල පරිපාලනමය කටයුතු සිදුකරනු ලබයි.

සමථකරණ ක්‍රියාවලිය මගින් පාර්ශවකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර ඇතිවන ආරවුල් විසඳාගැනීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස සමථකරුවන් කටයුතු කරනු ලබයි. සමථ මුල මණ්ඩලයට ලැබෙන ආරවුල් ප්‍රමාණය මත හා ඉන් නිරවුල්වන ආරවුල් ප්‍රමාණය මත සමථ මුල මණ්ඩලවල කාර්යක්ෂමතාවය මනිනු ලබයි. රුපියල් විසි පන්දහසක්ව පැවැති සමථ මණ්ඩල වෙත යොමු වන ආරවුල් වල මූල්‍යමය වටිනාකම 2011 අංක 04 දරන සමථ මණ්ඩල (සංශෝධිත ) පනත මගින් රුපියල් දෙලක්ෂ පනස් දහස දක්වා (250,000) වැඩි කිරීමෙන් හා බාල වයස්කාර දරුවන් විසින් සිදු කරනු ලබන වරදවල් සමථ මණ්ඩලය යටතට ගැනිම මගින් සමථ මණ්ඩල ක්‍රියාදාමය තව දුරටත් පුළුල් කර ඇත.


තමන්ගේ ගැටළු විසඳීමට පහසු හා අඩු වියදම් යාන්ත්‍රණයක් ලෙස ප්‍රජාව විසින් සමථකරණය පිළිගැනීමෙන් පසු ප්‍රජාව සමථකරණය දෙසට යොමුවීම ඉහල ගොස් ඇත. එම නිසා සෑම වසරකදීම ලක්ෂයකට අධික ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙතට යොමු වේ.

**2013.01.01 සිට 2013.12.31 දක්වා ප්‍රගතිය**

| | ආරවුල් සංඛ්‍යාව |
|---|---|
| සමථ මණ්ඩල වෙත යොමු කිරීම් | 172,892 |
| සමථයට පත් කිරිම් | 78,401 |
| ප්‍රතිශතය | 45% |

- **2013** වර්ෂය අවසන් වන විට පස්දින වැඩමුළු **53**ක් පවත්වා සමථකාරවරුන් **1900** ට ආසන්න ප්‍රමාණයක් පුහුණු කර ඇත.
- වැඩසටහන් සහකාර නිලධාරින් විසින් ප්‍රජා සමථකරණය, පාසැල් සමථකරණය හා වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. ඔවුන් පස්දින වැඩසටහන් **39**ක් ද, එක්දින වැඩසටහන් **31** ක්ද, තෙදින වැඩසටහන් **05** ක්ද, එක්දින පාසැල් සමථකරණ වැඩසටහන් **08** ක්ද පවත්වා ඇත.

**2013.01.01 - 2013.12.31** දින දක්වා පළාත් මට්ටමින් සමථ මණ්ඩල වල ආරවුල් ලැබීම




## 2013.1.1 සිට 2013.12.31 දින දක්වා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති සමථ මුල මණ්ඩල

| | දිස්ත්‍රික්කය | සමථ මුල මණ්ඩල |
|---|---|---|
| **01** | කොළඹ | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහරගම, තිඹිරිගස්යාය,හෝමාගම, රත්මලාන, කඩුවෙල |
| **02** | ගම්පහ | අත්තනගල්ල, වත්තල, ජාඇල, කටාන,මීරිගම |
| **03** | කළුතර | කළුතර,ඉංගිරිය,බේරුවල,මතුගම (පුරප්පාඩු) |
| **04** | ගාල්ල | හබරාදුව, අක්මීමන (පුරප්පාඩු), අම්බලන්ගොඩ, ඉමදුව, වැලිවිටිය, දිවිතුර, බද්දේගම,නාගොඩ |
| **05** | මාතර | මාතර,වැලිගම |
| **06** | හම්බන්තොට | හම්බන්තොට, කටුවන |
| **07** | කුරුණෑගල | වීරඹුගෙදර, මාස්පොත, බමුණාකොටුව, කුරුණෑගල, මල්ලවපිටිය, වාරියපොළ,මහව,කොටවෙහෙර,නක්කාවත්ත |

| | | |
|---|---|---|
| 08 | මහනුවර | පූජාපිටිය, අකුරණ, උඩුනුවර, උඩුදුම්බර,පන්විල,හාරිස්පත්තුව,පාතහේවාහැට |
| 09 | මාතලේ | උකුවෙල, යටවත්ත |
| 10 | නුවරඑළිය | කොත්මලේ |
| 11 | රත්නපුරය | රත්නපුරය, ඇලපාත, පැල්මඩුල්ල |
| 12 | කෑගල්ල | රුවන්වැල්ල, අරණායක,බුලත්කොහුපිටිය,කෑගල්ල |
| 13 | පොලොන්නරුව | වැලිකන්ද, ඇළහැර, මැදිරිගිරිය,ලංකාපුර |
| 14 | අනුරාධපුර | කහටගස්දිගිලිය (පුරප්පාඩු), හොරොව්පතාන (පුරප්පාඩු),කැබැතිගොල්ලෑව,මිහින්තලේ,නැගෙනහිර නුවර ගම් පළාත,මධ්‍යම නුවර ගම් පළාත,රාජාංගණය,තඹුත්තේගම |
| 15 | මොණරාගල | වැල්ලවාය, මොණරාගල, සෙවණගල |
| 16 | බදුල්ල | පස්සර |
| 17 | ත්‍රිකුණාමලය | මුතූර්, ත්‍රිකුණාමලය (කඩවත් සතර), කින්නියා (පුරප්පාඩු) පදවි ශ්‍රී පුර. කන්තලේ |
| 18 | වවුනියාව | වවුනියා උතුර, වවුනියාව(පුරප්පාඩු) |
| 19 | මඩකලපුව | වව්නතිවු, මන්මුනෙයිපත්තු, කාත්තන්කුඩි, වෙල්ලාවෙලි, වාකරෙයි, වාලච්චෙනෙයි, ඔට්ටමාවඩි, කිරාන්, කලවන්චිකුඩි, පඩිප්පලෙයි කෝරලේපත්තු මධ්‍යම වාලච්චේනෙයි |
| 20 | මුලතිවු | මරුදම්පටා (කරෙයිතුරෙයිපත්තු), තුනුක්කායි, මාන්තෙයි බටහිර |
| 21 | අම්පාර | අක්කරෙයිපත්තු (පුරප්පාඩු), සමන්තුරෙයි (පුරප්පාඩු),අම්පාර(පුරප්පාඩු) |
| 22 | කිලිනොච්චි | පූනකරි, කරච්චි (පුරප්පාඩු) |

**2013.01.01 දින සිට 2013.12.31 දින දක්වා පත් වීම් ලබා දී ඇති සමථ මූල මණ්ඩල**

| | දිස්ත්‍රික්කය | සමථ මූල මණ්ඩලය |
|---|---|---|
| 01 | කොළඹ | තිඹිරිගස්යාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| 02 | ගම්පහ | මිනුවන්ගොඩ, වත්තල, ජාඇල, කටාන |
| 03 | කළුතර | කළුතර, මතුගම (පුරප්පාඩු), |
| 04 | ගාල්ල | ඇල්පිටිය (පුරප්පාඩු), ඉමදූව, කරන්දෙණිය, හබරාදූව |
| 05 | මාතර | දෙවිනුවර, මුලටියන |
| 06 | හම්බන්තොට | අම්බලන්තොට, වීරකැටිය, බෙලිඅත්ත, තිස්සමහාරාමය |
| 07 | කුරුණෑගල | පඩුවස්නුවරනැගෙනහිර, අලව්ව, බමුණාකොටුව, මාස්පොත, අඹන්පොල |

| | | |
|---|---|---|
| 08 | පුත්තලම | මහකුඹුක්කඩවල, ආනමඩුව, නවගත්තේගම |
| 09 | මහනුවර | ගම්පොළ, ගලගෙදර, අකුරණ, පූජාපිටිය, උඩුනුවර |
| 10 | මාතලේ | උකුවෙල, දඹුල්ල |
| 11 | නුවරඑළිය | වලපනේ |
| 12 | රත්නපුරය | නිවිතිගල, ගොඩකවෙල, පැල්මඩුල්ල, රත්නපුර |
| 16 | කෑගල්ල | වරකාපොල (පුරප්පාඩු), ගලිගමුව, අරණායක, රත්නපුර, රුවැන්වැල්ල |
| 17 | පොළොන්නරුව | මැදිරිගිරිය, දිඹුලාගල, ඇළහැර, වැලිකන්ද |
| 18 | අනුරාධපුරය | තලාව, ගල්නෑව |
| 19 | මොණරාගල | වැල්ලවාය, මොණරාගල |
| 20 | බදුල්ල | ඇල්ල, හපුතලේ, හාලිඇල, හල්දුම්මුල්ල ( පුරප්පාඩු), වැලිමඩ, බදුල්ල, සොරණාතොට |
| 21 | ත්‍රිකුණාමලය | වෙරුගල්, කින්නියා |
| 22 | මඩකලපුව | මඩකලපුව, වෙන්කලඩි. එරාවූර්, වාකරෙයි |
| 23 | මුලතිවු | ඔඩ්ඩුසුඩාන්, පුදුකුඩියිරිප්පු |
| 24 | අම්පාර | කාරතිවු, සායින්දමරුදු , කල්මුණේ |
| 25 | මන්නාරම | මුසලි, නානට්ටාන්, මන්නාරම, මඩු |
| 26 | කිලිනොච්චි | කණ්ඩාවලෙයි, පුනකරි, පලෙයි (පච්චිලෙයිපල්ලි) |

**2013.01.01 සිට 2013 .12 .31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **202,898,500** | **197,855,369** | **98%** |
| ප්‍රග්ධන වියදම් | **1,706,800** | **1,349,377** | **79%** |
| එකතුව | **204,605,300** | **199,204,746** | **97%** |

# 07. අධිකරණ

පහත සඳහන් අධිකරණ සඳහා වූ ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ වැය සම්මතයට ඇතුළත්වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය
- මහාධිකරණ
- පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ
- දිසා අධිකරණ
- මහේස්ත්‍රාත් අධිකරණ
- කම්කරු විනිශ්චය සභා
- කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ 20 ක්, මහාධිකරණ 37ක්, දිසා/මහේස්ත්‍රාත්අධිකරණ 40ක්, දිසා අධිකරණ 70 ක්, මහේස්ත්‍රාත් අධිකරණ 78 ක්, සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 23 ක්, කම්කරු විනිශ්චය සභා 39 ක්, කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි 65 ක් සම්බන්ධයෙන් ගිණුම්කරණ වගකීම් අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ. මහාධිකරණ ගිණුම් කාර්යාල 25 ක් හරහා වියදම් බෙදා හැරේ.

## 7.1 ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබෙන සියළුම ඉල්ලුම්පත්‍ර එම අධිකරණය විසින් විභාග කරනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබාදෙයි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කටයුතු සම්බන්ධ අධිකරණ බලය
- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය
- උපදේශක අධිකරණ බලය
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය
- පාර්ලිමේන්තුව විසින් නිතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණයක් පිළිබඳ අධිකරණ බලය

## 2013.01.01 සිට 2013.12.31 දක්වා ප්‍රගතිය

| නඩු වර්ගය | 2012.12.31දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2013.01.01ට 2013.12.31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2013.01.01- 2013.12.31 දක්වා දිනට විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව | 2013.12.31 දිනට අවසන්කළ නඩු සංඛ්‍යාව | විභාග කිරීමට අවසරදුන් සංඛ්‍යාව | 2013.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 1045 | 405 | 1450 | 633 | - | 817 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 347 | 319 | 666 | 230 | 57 | 379 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 19 | 19 | 19 | - | 00 |
| අභියාචනා නඩු | 600 | 249 | 849 | 224 | - | 625 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 130 | 98 | 228 | 64 | 11 | 153 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 02 | 02 | 04 | 03 | - | 01 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1043 | 544 | 1587 | 378 | 106 | 1103 |
| ප්‍රතිශෝධන නඩු | 03 | 01 | 04 | 04 | - | 00 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | - | 01 | 01 | - | - | 01 |
| විවිධ නඩු | 02 | 06 | 08 | 02 | - | 06 |
| SC TAB APPEL | 01 | - | 01 | - | - | 01 |
| SC SPECIAL | - | 08 | 08 | 01 | - | 07 |
| SC ACCELARATION | - | 02 | 02 | 02 | - | 00 |
| එකතුව | 3173 | 1654 | 4827 | 1560 | 174 | 3093 |

## 2013.01.01 සිට 2013.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 58,100,000 | 54,163,108 | 93% |
| ප්‍රාග්ධන වියදම් | 14,200,000 | 10,481,400 | 74% |
| එකතුව | 72,300,000 | 64,644,508 | 89% |

## 7.2 අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණවල, කම්කරු විනිශ්චය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරණ සාපරාධී කරුණු වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.

**2013 .01.01 සිට 2013.12.31 දක්වා නඩු විමසීමේ කාර්ය සාධනය**

| නඩු වර්ගය | තීරණය වූ නඩු සංඛ්‍යාව |
|---|---|
| රිට් අයදුම්පත් | 368 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 193 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා | 472 |
| සිවිල් අභියාචනා | 648 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 83 |
| ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර අයදුම්පත් | 31 |
| වෙනත් අයදුම්පත් | 25 |

**2013.01.01 සිට 2013 .12 .31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන(රු) | වියදම (රු) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 45,100,000 | **42,807,249** | **95%** |
| ප්‍රාග්ධන වියදම් | 700,000 | **427,433** | **61%** |
| එකතුව | **45,800,000** | **43,234,682** | **94%** |

## 7.3 කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය

කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය අංක 428/11- ඒ, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පළමු මහලෙහි ස්ථාපිත කර ඇත.

1957 අංක 62 දරණ කාර්මික ආරවුල් පනතේ 31 (ආ) වගන්තිය ප්‍රකාරව ලැබෙන පැමිණිලි සම්බන්ධ ඉල්ලුම්පත් විභාග කොට විසඳීම කම්කරු විනිශ්චය සභා වෙත පැවරී ඇති මූලික වගකීමවේ. රාජ්‍ය නොවන ආයතනවල සේවක පක්ෂය රැකියාවලින් නෙරපීම් ආදී අසාධාරණකම් පිළිබඳව යුක්තිය ඉෂ්ඨ කරවා ගැනීම සඳහා ඔවුන්ට ඇති මහඟු වරප්‍රසාදයක් ලෙස කම්කරු විනිශ්චය සභා දැක්විය හැක. කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය යටතේ කම්කරු විනිශ්චය සභා 37 ක් ක්‍රියාත්මකවේ. යාපනය හා තංගල්ල යන ප්‍රදේශ වලද කම්කරු විනිශ්චය සභා පිහිටුවීමට යෝජිතව ඇත.

පහත සඳහන් ප්‍රදේශවල කම්කරු විනිශ්චය සභා ස්ථාපිතව ඇත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 06 | පානදුර | 01 | මහනුවර | 01 | අම්පාර | 01 |
| අවිස්සාවෙල්ල | 01 | කළුතර | 01 | පලාපත්වල | 01 | මඩකලපුව | 01 |
| රත්මලාන | 01 | ගාල්ල | 01 | නාවලපිටිය | 01 | ත්‍රිකුණාමලය | 01 |
| කඩුවෙල | 01 | මාතර | 01 | හැටන් | 01 | හලාවත | 01 |
| මහරගම | 01 | කොටපොල | 01 | තලවාකැලේ | 01 | අනුරාධපුරය | 01 |
| වත්තල | 01 | රත්නපුර | 01 | නුවරඑළිය | 01 | කුලියාපිටිය | 01 |
| ගම්පහ | 01 | කෑගල්ල | 01 | බදුල්ල | 01 | බලංගොඩ | 01 |
| මීගමුව | 02 | කුරුණෑගල | 01 | බණ්ඩාරවෙල | 01 | | |

බණ්ඩාරවෙල කම්කරු විනිශ්චය සභාව 2010/2011 ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියෙන් රාජ්‍ය අංශයේ ක්ෂුද්‍ර පරිමාණ කාණ්ඩය යටතේ දිවයිනේ සයවන ස්ථානය සහ ඌව පළාතේ ප්‍රථම ස්ථානය සහිතව B ශ්‍රේණියේ ජයග්‍රහණයක් ලබාගෙන ඇත.

කම්කරු විනිශ්චය සභා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව සම්පත්, මූල්‍ය සම්පත් ලබාදීම හා කළමනාකරණය කිරීම කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කාර්යයන්වේ. මේ හැර කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් හැර අනෙකුත් නිලධාරීන්ගේ ආයතන හා පරිපාලන කටයුතු සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම් ඇතුළුව සියළුම මූල්‍ය පරිපාලන හා ගිණුම් කටයුතු ද කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

**2013.01.01 දින 2013.12.31 දින දක්වා ප්‍රගතිය**

| 2013.01.01 දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව | 2013.01.01- 2013.12 .31 දක්වා | | 2013.12.31 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | පැවරු නඩු ගණන | විසඳු නඩු ගණන | |
| **6,464** | **2,510** | **2,537** | **5,437** |

අදාල කාලසීමාව තුල කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ හා සියළුම කම්කරු විනිශ්චය සභාවල නිලධාරීන් හා සේවකයින් දෙමළ භාෂා පාඨමාලා හා පොත්බැඳුම්කරු පාඨමාලා සඳහා පුහුණු විම් වලට යොමුකර ඇත.

කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා වියදම් කිරිම.

| තනතුර | ප්‍රමාණය | පාඨමාලාව | මුදල |
|---|---|---|---|
| කා.ක.ස | නිලධාරින් 03 | පොත් බැඳුම්කරු | **3750** |
| ගණකාධිකාරි | නිලධාරින් 01 | ඉංග්‍රිසි භාෂා ඩිප්ලෝමා<br>දෙමළ භාෂා ඩිප්ලෝමා<br>ගිණුම්කරණ ප්‍රමිති පාඨමාලාව | **40500**<br>**11000**<br>**500** |
| රා.ක.ස.සේ | නිලධාරින් 08<br>නිලධාරින් 16<br>නිලධාරින් 03 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දෙමළ උසස් පාඨමාලාව<br>රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දෙමළ මූලික පාඨමාලාව<br>ක්‍රමවේද හා කාර්යය අධ්‍යයනය පිළිබඳ එක්දින වැඩමුළුව | **64000**<br>**120000**<br>**9000** |
| කවිස සහකාර ලේකම් | නිලධාරින් 37 | සහකාර ලේකම් පුහුණු වැඩසටහන | **4865** |

තවද දැනුම හා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සභාපති/ අතිරේක මහේස්ත්‍රාත් වරුන් පස්දෙනෙකු කොළඹ විශ්ව විද්‍යාලයේ පවත්වනු ලබන පශ්චාත් නීති උපාධි පාඨමාලාව හදාරමින් සිටී. සභාපති/අතිරේක මහේස්ත්‍රත්වරු දෙදෙනෙකු ලෝක කම්කරු සංවිධානයේ පුහුණු ආයතනය මඟින් පවත්වනු ලබන විනිසුරුවරු සඳහා වන සති දෙකක විදේශ පුහුණුවක් සඳහා සහභාගි කරවීය.

**2013.01.01 දින සිට 2013 .12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | ප්‍රතිපාදන (රු) | වියදම (රු) | ප්‍රගතිය(%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **216,012,912** | **213,619,428** | **99%** |
| ප්‍රාග්ධන වියදම් | **13,040,000** | **12,416,191** | **95%** |
| එකතුව | **229,052,912** | **226,035,619** | **99%** |

## 7.4 කාති අභියාචනා මණ්ඩලය සහ කාති උසාවි

කාති උසාවි යනු 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද ලියාපදිංචි කිරීමේ පනත අනුව පිහිටුවනු ලැබූ විශේෂිත අධිකරණයකි. මෙම අධිකරණය විසින් මුස්ලිම් විවාහ සම්බන්ධ අධිකරණ කටයුතු ඔවුන්ගේ සිරිත් වලට අනුව ක්‍රියාත්මක කරනු ලැබේ. ඉස්ලාම් භක්තිකයන් පස් දෙනෙකුගෙන් කාති අභියාචනා මණ්ඩලය සමන්විත වන අතර කාති අධිකරණවල අභියාචනා විභාග කිරිමට ක්‍රියාත්මකවේ. මෙම කාති උසාවි සහ අභියාචනා මණ්ඩලයේ පරිපාලන කටයුතු 2005.10.08 දිනැති ගැසට් පත්‍රයට අනුව අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත පැවරුණු අතර ඊට පෙර එම කටයුතු ක්‍රියාත්මක වූයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගිනි. වර්තමානයේ කාති උසාවි 65 ක් සහ එක් කාති අභියාචනා මණ්ඩලයක් ක්‍රියාත්මකවේ.

**කාති උසාවි**

| | | |
|---|---|---|
| අඬ්ඩාලච්චේන | කල්මුණේ | පාතහේවාහැට |
| අක්කරෙයිපත්තුව | කල්පිටිය | පානදුර |
| අකුරණ | කළුතර | පොලොන්නරුව |
| අනුරාධපුරය | මහනුවර | පොතුවිල් |
| අවිස්සාවේල්ල | කාතන්කුඩි (මන්මුනායිපත්තු) | පුල්මුඩේ |
| බදුල්ල | කෑගල්ල | පුත්තලම සහ හලාවත |
| බලපිටිය සහ ඇල්පිටිය | කින්නියා | රත්නපුර |
| බේරුවල | කුලියාපිටිය | සරණාගත ජනසමූහය (කල්පිටිය -පුත්තලම) |
| බෝරා ජනසමූහය | කුරුණෑගල | සායින්දමරුදු |
| බියගම | මහව | සම්මන්තුරෙයි |
| කොළඹ නැගෙනහිර | මන්නාරම | තඹලගමුව සහ කන්තලේ |
| කොළඹ උතුර | මාතලේ | තංගල්ල |
| කොළඹ දකුණ | මාතර | ත්‍රිකුණාමලය |
| කොළඹ බටහිර | මාවනැල්ල | තුම්පනේ |
| එරාවූර් | මෙමොන් ජනසමූහය | ගම්පොල උඩපලාත |
| ගාල්ල | මොණරාගල | උඩතලවින්න |
| ගම්පහ (තිහාරිය) | මූතූර් | උඩුනුවර |
| හම්බන්තොට | නාවලපිටිය | වලච්චේන |
| හාරිස්පත්තුව හා පූජාපිටිය | මීගමුව | වවුනියාව |
| හැටන් | නින්දවූර්පත්තු | යටිනුවර |
| හොරණ | නුවර එළිය | යාපනය |
| ඉරක්කාමම් | ඔට්ටමාවඩි | |

කාති අභියාචනා මණ්ඩලයේ ප්‍රගතිය (2010 – 2013 දෙසැම්බර් 31 දක්වා )

| වර්ෂය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| **2010** | **276** | **184** | **92** |
| **2011** | **160** | **48** | **112** |
| **2012** | **206** | **69** | **137** |
| **2013** | **219** | **65** | **154** |

කාති උසාවිවල ප්‍රගතිය (2010 - 2013 දෙසැම්බර් 31 දක්වා)

| වර්ෂය | මුළු පැමිණිලි සංඛ්‍යාව | අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| **2010** | **11,239** | **6,249** | **4,990** |
| **2011** | **10,554** | **5,789** | **4,768** |
| **2012** | **13,226** | **8,651** | **4,575** |
| **2013** | **12,735** | **7,660** | **5,075** |

ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති කාති අධිකරණ

| | | |
|---|---|---|
| • ඔට්ටමාවඩි | • හොරොම්බාව | • පොතුවිල් |
| • ඉරක්කාමම් | • මාතලේ | |

ඉදිකිරීම් සිදුකරමින් පවතින කාති අධිකරණ

| | | |
|---|---|---|
| • වෙල්ලමනල් | • පෙරියමඩු (මාන්නායි) | • කුරුණෑගල |

පහත ප්‍රදේශවල කාති උසාවි ඉදිකිරීමට යෝජනා කර ඇත.

| | | |
|---|---|---|
| • අඩ්ඩාලච්චේන | • සයින්දමරුදු | • වලච්චේන |
| • මුසලි | | |

## 08. අනුබද්ධිත ආයතන

### 8.1 නීති විද්‍යාලය

**1990 සංශෝධිත නීති අධ්‍යයන සභා පනත යටතේ පිහිටුවන ලද නීති අධ්‍යාපන සභාව, ශ්‍රී ලංකා නීති විද්‍යාලීය කළමනාකරණයේ වගකීම දරනු ලබයි. අධිකරණ අමාත්‍යවරයාගේ එකඟතාවය මත නීති අධ්‍යාපන සභාව විසින් සකස් කරන ලද නීති අනුව නීති විද්‍යාලය ක්‍රියාත්මකවේ. නීති අධ්‍යාපන සභාවේ සභාපතිත්වය ගරු අගවිනිසුරුතුමා විසින් හොබවන අතර නම්කරන / පත්කරන ලබන සමාජිකයන් 10 දෙනෙකුගෙන් සභාව සමන්විත වේ. අගවිනිසුරුතුමා විසින් නම් කරන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකුගෙන්ද ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සමාජිකයන් දෙදෙනෙකුගෙන්ද අධිකරණ අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සමාජිකයන් හය දෙනෙකුගෙන්ද හා නිලබලයෙන් පත්වන සාමාජිකයන් 03 කුගෙන් මෙම සභාව සමන්විත වෙයි. නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනා ලෙස ගරු නීතිපතිතුමා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ගරු සොලිසිටර් ජනරාල් නම් කර ඇත.**

**නීති විද්‍යාලය වසර 3 1/2 ක පාඨමාලාවක් පවත්වන අතර එක් එක් වසර අවසානයේ පවත්වන පරීක්ෂණ තුනෙන් සමත්වන අපේක්ෂකයින් නීතිඥවරුන් ලෙස බඳවා ගනු ලැබීමට සුදුසුකම් ලබයි. මෙම නීති සිසුන් නීතිඥයකු ලෙස දිවුරුම්දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලුම් කිරීමට පෙර අවුරුදු 08 ක අවම පළපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු යටතේ මාස 06 ක ආධුනික කාලයක් ගත කිරීම අවශ්‍ය වෙයි.**

**මෙම ආයතනය ස්වයංමූල්‍ය සංවිධානයක් ලෙස ක්‍රියාත්මකවේ. එසේම නීතිඥ වෘත්තියේ ඉතාමත් දක්ෂ හා පළපුරුදු සම්පත් දායකයින් විසින් දේශන පවත්වනු ලබයි.**